සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 60 S I,II |
|---|---|---|
| නම: ........................................... | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | කාලය පැය තුනයි |

- **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

## I කොටස

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් 01 සිට 04 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

මලීෂා විසින් කුරුණෑගල දඹුල්ල ප්‍රධාන පාරට යාබදව පළතුරු බීම අලෙවිසැලක් පවත්වාගෙන යයි. මෙහි මුදල් අයකැමි ලෙස සමාධි බඳවාගෙන ඇත.

01) මලීෂාගේ ව්‍යාපාරය සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව වනුයේ,
i) පළතුරු බීම ii) ආහාර iii) සෞඛ්‍යය iv) පළතුරු

02) මලීෂාගේ ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණක් වන්නේ,
i) භාණ්ඩ හා සේවාවල ගුණාත්මය ඉහළ නැංවීම. ii) රැකියා උත්පාදනය
iii) සේවක සුභසාධනය iv) ලාභ ඉපැයීම

03) මෙම සිද්ධියට අනුව මලීෂා අයත්වන නිෂ්පාදන සාධකය වනුයේ,
i) ශ්‍රමය ii) ප්‍රාග්ධනය iii) ව්‍යවසාය iv) අයිතිකරු

04) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් වන සමාධිගේ අරමුණක් වන්නේ,
i) රැකියා සුරක්ෂිත බව . ii) අඛණ්ඩව ඇණවුම් ලබාගැනීම.
iii) ප්‍රමාණවත් ලාභයක් ලැබීම. iv) ව්‍යාපාරයේ අනාගත ප්‍රවර්ධනය.

05) අවශ්‍යතා හා උවමනා සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
i) අවශ්‍යතා සීමිත වන අතර උවමනා අසීමිත වේ.
ii) අවශ්‍යතා පොදු වන අතර උවමනා විවිධ වේ.
iii) අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර උවමනා නිර්මාණය කළ නොහැකිය.
iv) අවශ්‍යතා අත්‍යාවශ්‍ය වන අතර උවමනා අත්‍යාවශ්‍ය නොවේ.

06) පහත "X" තීරුවේ ඇල්මැති පාර්ශවය "Y" තීරුවේ ව්‍යාපාර අපේක්ෂිත දායකත්වය සමඟ අනුපිළිවෙළින් ගළපන්න.

| "X" | "Y" |
|---|---|
| 1. අයිතිකරුවන් | A නිවැරදි තීරණ ගැනීම. |
| 2. කළමනාකරුවන් | B කලට වෙලාවට අමුද්‍රව්‍ය සැපයීම. |
| 3. සේවකයින් | C ප්‍රමාණවත් ප්‍රාග්ධන දායකත්වය. |
| 4. සැපයුම්කරුවෝ | D පවරන ලද කාර්යය නිසි ලෙස ඉටුකිරීම. |

i) CADB ii) CABD iii) CDAB iv) CDBA

07) ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
i) සේවකයෝ,ගෝලීය පරිසරය, ණයදෙනුකරුවෝ, තරඟකරුවෝ.
ii) ගෝලීය පරිසරය, සැපයුම්කරුවෝ, තරඟකරුවෝ, ණයදෙනුකරුවෝ.
iii) කළමනාකරුවෝ, තරඟකරුවෝ, ණයදෙනුකරුවෝ, සැපයම්කරුවෝ.
iv) කළමනාකරුවෝ, ගෝලීය පරිසරය, තරඟකරුවෝ, සැපයුම්කරුවෝ.

08) රජයන් විසින් සිය අයවැය ප්‍රතිපත්ති ක්‍රියාවලියට නැංවීම සිදුකරනු ලබයි. මෙම " අයවැය ප්‍රතිපත්ති" අයත්වන ව්‍යාපාර පරිසරය වන්නේ,
i) නෛතික පරිසරය ii) ආර්ථික පරිසරය
iii) තාක්ෂණික පරිසරය iv) දේශපාලන පරිසරය

09) තාක්ෂණික පරිසරයේ සිදුවන සීඝ්‍ර වෙනස්වීම් මගින් ව්‍යාපාර වලට එල්ලවන අහිතකර බලපෑමක් වන්නේ,
i) භාණ්ඩ හා සේවා ඉතා ඉක්මනින් යල්පැනීම. ii) භාණ්ඩ හා සේවා නවීකරණය වීම.
iii) ලාභය ඉහළ යෑම. iv) වෙළඳපොල කොටස් පුළුල්වීම.

10) පහත දැක්වෙන විදේශ මුදල් වර්ග අතරින් ශ්‍රී ලංකා රුපියලේ අගයට හුවමාරු අගය අඩුම මුදල් වර්ගය වන්නේ ,

i) ඇමෙරිකානු ඩොලරය  ii) බ්‍රිතාන්‍ය පවුම  iii) ජපන් යෙන්  iv) යුරෝ

11) ව්‍යාපාර සංවිධාන විවිධ නිර්ණායක මත වර්ග කළ හැකිය. එවැනි නිර්ණායකයක් වන්නේ,

i) රාජ්‍ය අංශය අනුව.  ii) පෞද්ගලික අංශය අනුව
iii) අරමුණ අනුව  iv) පොදු අංශය අනුව

12) පෞද්ගලික අංශය සතු ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් වන්නේ,

i) සමිති සංවිධාන, රාජ්‍ය දෙපාර්තමේන්තු  ii) රාජ්‍ය සංස්ථා, සමූපකාර සමිති
iii) හවුල් ව්‍යාපාර, රාජ්‍ය සමාගම්  iv) සමූපකාර සමිති, සමිති සංවිධාන

13) ඒකපුද්ගල ව්‍යාපාරයකට වඩා සංස්ථාපිත සමාගමක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට රුචිකත්වයක් දක්වන්නේ,

i) අසීමිත වගකීම.  ii) ලාභය බෙදීයාම.
iii) නෛතික පුද්ගලභාවය  iv) තීරණ ගැනීම පහසුවීම.

14) ව්‍යාපාර සංවිධානයක් තෝරාගැනීමේදී ප්‍රධාන වශයෙන් අරමුණු දෙකක් පදනම් වේ. එම අරමුණු නම්,

i) මිනිස් අවශ්‍යතා හා උවමනා.  ii) සුළු පරිමාණද මහා පරිමාණද යන්න.
iii) සමාජ සුබසාධනය හා සේවක සුබසාධනය  iv) ලාභ ලැබීම හා සමාජ සුබසාධනය

15) ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු පුද්ගලයින් කිහිප දෙනෙකු මඟින් සිදුකරගැනීමට අපේක්ෂා කරන්නේ නම්, වඩාත් උචිත ව්‍යාපාර සංවිධාන ක්‍රමය වන්නේ,

i) සමිති සංවිධාන.  ii) හවුල් ව්‍යාපාර  iii) තනි පුද්ගල ව්‍යාපාර  iv) සමූපකාර සමිති

16) ඒකපුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර ව්‍යාපාර නාමය ලියාපදිංචිය සඳහා අයදුම්පත,

i) දින 07ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.  ii) දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.
iii) දින 21ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.  iv) දින 28ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

17) " අමන්දි හිරන්‍යාගේ ව්‍යාපාරය" " අමන්දි" නමින් පවත්වාගෙන යන්නේ නම්, ලියාපදිංචියට අදාල නිවැරදි ප්‍රකාශය වන්නේ,

i) අමන්දි හිරන්‍යා නමින් ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුය.
ii) ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අදාල නොවේ.
iii) ව්‍යපාර සඳහා නෛතික පුද්ගලභාවයක් හිමිවේ.
iv) ප්‍රාදේශිය සභාවෙන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය ලබාගත යුතුය.

- ව්‍යාපාරයක පහත දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් සැලකිල්ලට ගන්න.

A. යන්ත්‍රෝපකරණ  E. භාණ්ඩ තොගය
B. විදුලි වියදම්  F. මුදල් ශේෂය
C. ලී බඩු උපකරණ  G. ණය හිමියෝ.
D. කෙටිකාලීන බැංකු ණය  H. ගෙවිය යුතු බිල්

ඉහත තොරතුරු අනුව ප්‍රශ්න අංක (18), (19) ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

18) ජංගම වත්කම් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

i) HE  ii) DG  iii) GH  iv) EF

19) D වලින් දැක්වෙන අයිතමය වන්නේ,

i) ජංගම වත්කමකි.  ii) ජංගම වගකීමකි.
iii) ජංගම නොවන වගකීමකි.  iv) ජංගම නොවන වත්කමකි.

20) වගකීමක ලක්ෂණයක් නොවන්නේ,

i) අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම.
ii) වර්තමාන බැඳීමක් පැවතීම.
iii) අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම.
iv) බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලායාම.

- ව්‍යාපාරයක සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.
  A. රුපියල් 500 000ක ප්‍රාග්ධනය යෙදීම.
  B. විකිණීම සඳහා රුපියල් 100000 වටිනා තොගයක් මිලදී ගැනීම.
  C. රුපියල් 2500ක් ණය හිමියන්ට ගෙවීම.
  D. ගොඩනැගිලි කුලී ගෙවීම රුපියල් 10,000
  E. බැංකු ණයක් ලබාගැනීම රුපියල් 400, 000කි.

21) වත්කම් අඩුවීම, වත්කම් වැඩිවීම දැක්වෙන්නේ,
i) E ii) B iii) D iv) A

22) වත්කම් අඩුවීම, වගකීම් වැඩිවීම දැක්වෙන්නේ,
i) B ii) C iii) D iv) E

23) රුපියල් 25,000ක් වටිනා භාණ්ඩ තොගයක්, රුපියල් 30,000කට ණයට විකිණීමේදී ගිණුම්කරණ සමීකරණයට ඇතිවන බලපෑම වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| i) | -25000 (තොගය) + 30,000 (ණයගැති) | = | +5000 (ලාභය) | + | - |
| ii) | +30000 (ණයගැති) + 30,000 (තොගය) | = | - | + | - |
| iii) | +25000 (ණයගැති) + 30,000 (ණයගැති) | = | -5000 (අලාභය) | + | - |
| iv) | +25000 (තොගය) + 25,000 (ණයගැති) | = | - | + | - |

24) හිමකම වෙනස්වීම සඳහා බලපාන ගණුදෙනුවක් නොවන්නේ,
i) අමතර ප්‍රාග්ධනය යෙදීම. ii) ගැනිලි iii) ගැණුම් iv) ආදායම්

25) " වැඩිවීම හර" " අඩුවීම බැර" යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපණය වන ගිණුම වන්නේ,
i) ප්‍රාග්ධන ගිණුම ii) මුදල් ගිණුම
iii) ණයහිමි ගිණුම iv) ගෙවිය යුතු වියදම් ගිණුම

26) ලෙජරය යනුවෙන් අදහස් කරනුයේ,
i) ගිණුමකි. ii) මූලික සටහන් පොතකි.
iii) ගිණුම් සියල්ලගේ එකතුවකි. iv) මූලාශ්‍ර ලේඛණයකි.

27) A කොටස සහ B කොටස නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| A | B |
|---|---|
| i) ණයගැති ගිණුම | A වගකීම් ගිණුමකි. |
| ii) ගෙවිය යුතු වියදම් ගිණුම | B වියදම් ගිණුමකි. |
| iii) ගැණිලි ගිණුම | C වත්කම් ගිණුමකි. |
| iv) ගැටුප් ගිණුම | D හිමිකම් ගිණුමකි. |

i) ABCD ii) CBAD iii) CADB iv) CABD

28) ගණුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.
ණයහිමි ගිණුම හර රු. 10, 000 මුදල් ගිණුම බැර රු. 10,000

සිදුවී ඇති ගණුදෙනුව වන්නේ,
i) රුපියල් 10,000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම.
ii) ණය හිමියන්ට රුපියල් 10,000ක මුදලක් ගෙවීම.
iii) රුපියල් 10,000ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම.
iv) රුපියල් 10, 000ක භාණ්ඩ තොගයක් ණයට විකිණීම.

29) සී/ස පෙරේරා සමාගම රුපියල් 500,000ක් වටිනා මෝටර් රථයක් ණයට ගැනීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

i) ගැණුම් ගිණුම හර 500 000
සී/ස පෙරේරා සමාගම බැර 500 000

ii) මෝටර් රථ ගිණුම හර 500 000
ගැණුම් ගිණුම බැර 500 000

iii) මෝටර් රථ ගිණුම හර 500 000
සී/ස පෙරේරා සමාගම බැර 500 000

iv) මෝටර් රථ ගිණුම හර 500 000
සී/ස පෙරේරා සමාගම බැර 500 000

30) මූලාශ්‍ර ලේඛණයක් සම්බන්ධව වැරදි ප්‍රකාශය වන්නේ,

i) සෑම ගණුදෙනුවකින්ම මූලාශ්‍ර ලේඛණයක් බිහිවේ.
ii) මූලාශ්‍ර ලේඛණ වල ද්විත්ව සටහන් මූලධර්මය අනුව ගණුදෙනු සටහන් කෙරේ.
iii) ගණුදෙනුව සිදුවූ අවස්ථාවේම සියලු විස්තර මූලාශ්‍ර ලේඛණයක සටහන් කෙරේ.
iv) මූලාශ්‍ර ලේඛණ උපයෝගී කරගෙන ගණුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කරයි.

31) මූලාශ්‍ර ලේඛණයක තිබිය යුතු මූලික තොරතුරක් නොවන්නේ,

i) ගණුදෙනුව සිදුවූ දිනය ii) නිළ මුද්‍රාව iii) සංලක්ෂය iv) වටිනාකම

32) චෙක්පත් වලින් මුදල් ගෙවීමට අදාල මූලාශ්‍ර ලේඛණය හා මූලික සටහන් පොත නිවැරදිව දැක්වෙන්නේ,

i) වවුචරය - මුදල් පොත
ii) පිළිපත - මුදල් පොත
iv) බැංකු ගිණුම - මුදල් පොත
iv) පිළිපත - බැංකු ගිණුම

33) වට්ටම් තීරු සහිත මුදල් පොතක හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව,

i) දුන් වට්ටම් ගිණුමට හර කරයි.
ii) ලද වට්ටම් ගිණුමට හර කරයි.
iii) දුන් වට්ටම් ගිණුමට බැර කරයි.
iv) ලද වට්ටම් ගිණුමට බැර කරයි.

- නදීත්ගේ ලී බඩු අලෙවිසැලේ සිදුවූ ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් 34,35,36 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A. රුපියල් 75,000ක ලී බඩු ණයට ගැනීම.
B. රුපියල් 45,000ක කෑම මේසයක් අත්පිට විකිණීම.
C. රුපියල් 150ක මුද්දර මිලට ගැනීම.
D. රුපියල් 90, 000කට අල්මාරියක් මිලදී ගැනීම.

34) ඉහත ගණුදෙනු අතරින් මුදල් පොතක සටහන් කරන ගණුදෙනු වන්නේ,

i) A හා B ය. ii) B හා C ය. iii) B හා D ය. iv) C හා D ය.

35) A හා B ගණුදෙනු වලට අදාල නිවැරදි මූලාශ්‍ර ලේඛණ වනුයේ,

i) ගැනුම් ඉන්වොයිසිය - ලදුපත
ii) ගැනුම් ඉන්වොයිසිය - වවුචරය
iii) ගැනුම්ජ'නලය - මුදල් පොත
iv) ගැනුම් ඉන්වොයිසිය - ගැනුම් ජ'නලය

36) ඉහත කී D ගණුදෙනුව නිසා,

i) මුදල් වත්කම් පමණක් වැඩිවේ.
ii) ලී බඩු වත්කම් පමණක් වැඩිවේ.
iii) මුදල් වත්කම වැඩිවී ලී බඩු වත්කම අඩුවේ.
iv) මුදල් වත්කම අඩුවී ලී බඩු වත්කම වැඩි වේ.

37) බැංකු ජංගම ගිණුමක ගණුදෙනු සටහන් කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරනු ලබන ද්විත්ව සටහන් රීතිය වනුයේ,

i) වගකීම් පිළිබඳ රීතියයි.
ii) වත්කම් පිළිබඳ රීතියයි.
iii) වියදම් පිළිබඳ රීතියයි.
iv) ඉහත කිසිවක් නොවේ.

38) සචින්ත රෙදිපිළි ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර, ඔහුට රෙදිපිළි විකිණීම වෙනුවෙන් ලද රු.10000ක චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කරන ලදි. මෙම ගණුදෙනුවට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

i) මුදල් පොත හර රු.100 000
බැංකු ගිණුම බැර රු. 100 000

ii) මුදල් පොත හර රු.100 000.
විකුණුම් ගිණුම බැර රු.100 000

iii) බැංකු ගිණුම හර රු. 100 000
මුදල් පොත බැර රු. 100 000

iv) බැංකු ගිණුම හර රු.100 000
විකුණුම් ගිණුම බැර රු. 100 000

39) පහත A,B,C, කරුණු අතුරෙන් චෙක්පතක් අගරු වන අවස්ථාව වනුයේ,

A චෙක්පත අවිදිමත් ලෙස ලියා තිබීම.
B ජංගම ගිණුමේ මුදල් නොමැති වීම.
C චෙක්පතට තබා ඇති අත්සන ආදර්ශ අත්සනට වෙනස් වීම.

i) A පමණි. ii) B පමණි. iii) C පමණි. iv) ඉහත සියල්ලම.

40) ණයහිමියෙකු සඳහා ව්‍යාපාරයක් නිකුත් කළ රුපියල් 50,000ක චෙක්පත් අගරු වූ බව බැංකුව දැනුම්දීමට අදාල නිවැරදි ද්විත්ව සටහන නම්,

i) බැංකු ගිණුම හර රු. 50 000
ණයහිමි ගිණුම බැර රු. 50 000

ii) ණයහිමි ගිණුම හර රු. 50 000
බැංකු ගිණුම බැර රු. 50 000

iii) ණයහිමි ගිණුම හර රු. 50 000
මුදල් පොත බැර රු. 50 000.

iv) මුදල් පොත හර රු. 50 000
ණයහිමි ගිණුම බැර රු. 50 000

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 60 S I,II

නම: ............................................ **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය** කාලය පැය දෙකයි

- **පළමු ප්‍රශ්නයද, I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) පහත සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ මැහුම් පාඨමාලාවක් හදාරා ඇති බිනාරා 2024/03/01 දින ''බිනූ ටේ්‍රලර්ස් '' නමින් ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් නගරයේ පාසල ආසන්නයේම ආරම්භ කරන ලදි. බිනාරා රු. 500,000ක් මුදලින් යොදවන ලදි. ඊට අමතරව 65,000/ක් වටිනා ලී බඩු උපකරණද යොදවන ලදි. එදිනම ලංකා බැංකුවෙන් රු. 500,000ක ණය මුදලක් (වසර 02) ලබාගත් අතර එයින් රු. 60,000/ක් වටිනා මහන මැෂින් මිලට ගන්නා ලදි.

බිනාරා ටේ්‍රලර්ස් ව්‍යාපාරයේ 2024/03/31න් අවසන් මාසය සඳහා පහත තොරතුරු සපයා ඇත.

- රෙදි මිලට ගැනීම — අත්පිට 38 500 — ණයට 90 000
- නිමි ඇඳුම් විකිණීම — අත්පිට 120 000 — ණයට 25 250
- ගොඩනැගිලි කුළී — 20 000
- දුරකථන ගාස්තු — 1500
- විදුලි ගාස්තු — 10 500

2024/04/01 දින බිනාරා සිය සොයුරිය තත්සරාද රු. 600 000ක ප්‍රාග්ධනයක් සමඟ ව්‍යාපාරයට සම්බන්ධ කරගන්නා ලදි.

(i) අ) මෙම ව්‍යාපාරය මගින් සපුරාලන මිනිස් අවශ්‍යතා දක්වන්න. (ල.02)
ආ) මෙහි ප්‍රාග්ධනය යටතට ගැනෙන නිෂ්පාදන සාධක දෙකක් ලියන්න. (ල.02)

(ii) අ) මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න. (ල.02)
ආ) මෙම සිද්ධියට අදාළ අභ්‍යන්තර හා බාහිර පරිසර සාධකය බැගින් ලියන්න. (ල.02)

(iii) අ) මෙම ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් ලියා දක්වන්න. (ල.02)
ආ) වෘත්තීය පුහුණු අධිකාරිය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද? (ල.02)

(iv) අ) ''බිනූ ටේ්‍රලර්ස්'' ව්‍යාපාරය හිමිකාරිත්වය අනුව වර්ගකිරීමේදී අයත් වන ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්ද?. (ල.02)
ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ල.02)

(v) අ) ''බිනූ ටේ්‍රලර්ස් '' ලියාපදිංචි කළ යුතු ආකාරය දක්වන්න. (ල.02)
ආ) බිනාරාගේ ව්‍යාපාරයට තත්සරා සම්බන්ධ වූ විට ආරම්භ කිරීමට වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක්ද? (ල.02)

(vi) අ) මෙම ව්‍යාපරයේ ජංගම වත්කමක් හා ජංගම නොවන වත්කමක් දක්වන්න. (ල.02)
ආ) මෙම ව්‍යාපාරයේ පවත්වාගෙන යන මූලික සටහන් පොතක් හා එයට අදාළ මූලාශ්‍ර ලේඛණ දක්වන්න. (ල.02)

(vii) අ) මෙම ව්‍යාපරයේ ජංගම වගකීමක් හා ජංගම නොවන වගකීමක් දක්වන්න. (ල.02)
ආ) මෙම ව්‍යාපාරයේ මාර්තු මාසය සඳහා ගැනුම් ගිණුම දක්වන්න. (ල.02)

(viii) අ) බැංකු ණය ලබාගැනිමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ල.02)
ආ) එය ගිණුම්ගත කර පෙන්වන්න. (ල.02)

(ix) අ) ''බිනූ ටේ්‍රලර්ස්'' හි 2024/03/01 දින ආරම්භක හිමිකම කොපමණද? (ල.02)
ආ) 2024/03/01 දිනට බැංකු ණය ලබාගෙන මහන මැෂිම මිලට ගැනීමෙන් පසු ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය දක්වන්න. (ල.02)

(x) බිනාරා ටේ්‍රලර්ස් ව්‍යාපාරයේ 2024/03/31න් අවසන් මාසය සඳහා මුදල් ශේෂය ගණනය කරන්න. (ල.02)

## I කොටස ව්‍යාපාර අධ්‍යයනය

02) i) තාක්ෂණික පරිසරය සීඝ්‍රයෙන් වර්ධනයට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල.02)

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයක් තුලින් ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක. (..............)
ආ) ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වය සංස්ථාපිත සමාගම්වල ලක්ෂණයක් වේ. (..............)
ඉ) මූල්‍ය නීති සංග්‍රහය, ආයතන සංග්‍රහය හා චක්‍රලේඛණ සමාගම් වලට බලපායි. (..............)
ඊ) ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය තුළින් අවස්ථා හා තර්ජන හඳුනාගත හැක. (..............)
(ල. 1/2×4=02)

iii) ඕනෑම ව්‍යාපාරයකට ඒ හා සම්බන්ධ වටපිටාවක් ඇත. එය ව්‍යාපාරයට ඍජුව හෝ වක්‍රව බලපෑම් ඇති කරයි.
අ) ආර්ථික පරිසරය යනු කුමක් ද?
ආ) ආර්ථික පරිසරය කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න. (ල.02)

iv) ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් අතර ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැදීමයි.
අ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයේ සිදුවන හිතකර බලපෑම් දෙකක් ලියන්න.
ආ) දේශීය ව්‍යාපාර වලට ගෝලීය පරිසරයේ අහිතකර බලපෑම් දෙකක් ලියන්න. (ල.02)

03) i) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ වර්ගයේ ව්‍යාපාර සංවිධාන බිහිවී ඇත. ව්‍යාපාර සංවිධානයක් යන්න හඳුන්වන්න. (ල.02)

ii) ව්‍යාපාර විවිධ ආකාරයට සංවිධාන වී ඇති බැවින් විවිධ නිර්ණායක මත වර්ග කළ හැකිය.

අ) ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි නිර්ණායක දෙකක් ලියන්න.
ආ) රාජ්‍ය (පොදු) අංශ යටතේ ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න. (ල.02)

iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ) දෙපාර්තමේන්තු වලට තීරණ ගැනීමට පූර්ණ නිදහසක් නැත. (..............)
ආ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම මඟින් ඒක පුද්ගල ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබේ (..............)
ඉ) රාජ්‍ය සංස්ථාවල වාසියක් ලෙස ලාභය මහජනතාව සතුවීම. (..............)
ඊ) හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු.1000ක් හෝ ඊට වඩා වැඩිනම් හවුල් ගිවිසුම ලිඛිත විය යුතුයි. (..............)
(ල. 1/2×4=02)

iv) අමාෂා හා දුෂනි එක්ව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර " Two Sha " නමින් පවත්වාගෙන යන ලදි. පසුව කළමනාකරණය සඳහා සෝනුක බඳවා ගන්නා ලදි.
අ) කළමනාකරණය යනු කුමක් ද?
ආ) මෙම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ වාසි දෙකක් ලියන්න. (ල.02)

04) i) පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන කිහිපයක නාමයන්ය.
සීමා සහිත උපාලි සමාගම
පෙරේරා සහ පුත්‍රයෝ
කැකුළු ළමා සමාජය
කෘෂි රක්ෂණ මණ්ඩලය
නඳුන් ස්ටෝර්ස්
සීමාසහිත ගොඩගම සමූපාකාර සමිතිය
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

ඉහත සඳහන් ව්‍යාපාර ආයතන හිමිකාරිත්වය අනුව වර්ග කර දක්වන්න. (ල.02)

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යයද අසත්‍යය ද යන්න දක්වන්න.
අ) තනි පුද්ගල ව්‍යාපාර ලියාපදිංචිය අනිවාර්ය වේ. (..............)
ආ) රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා නීතිමය පුද්ගලභාවයක් නැත. (..............)
ඇ) පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලපෑම අවම කිරීම සඳහා රාජ්‍ය සංස්ථා දායක වේ. (..............)
ඉ) සංස්ථාපිත සමාගමක් ලියාපදිංචි කල යුත්තේ අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් කාර්යාලයේදී ය. (..............)
(ල. 1/2×4=02)

iii) අ) හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව අතර ඇති වෙනස පැහැදිලි කරන්න.
ආ) හවුල් ව්‍යාපාර සඳහා බලපාන ලබන අණපනත් දෙකක් ලියන්න. (ල.02)

iv) අ) අනෙකුත් ව්‍යාපාර සංවිධාන වලට සාපේක්ෂව සමූපකාර වල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
ආ) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් තනි පුද්ගල ව්‍යාපාර වලට ලැබෙන වාසි දෙකක් ලියන්න.(ල.2)

## II කොටස - ගිණුම්කරණය

05) i) ගිණුම්කරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?. (ල.02)

ii) පහත සඳහන් ගණුදෙනුවලට අදාල ද්විත්ව සටහන් ලියන්න.

අ) ව්‍යාපාරයේ පරිහරණය සඳහා රු. 100 000 කාර්යාල උපකරණ මිලදී ගැනීම.

ආ) ණයගැතියන්ගෙන් මුදල් ලැබීම.රු. 25 000 කි (ල.02)

iii) නිසල් විසින් ආරම්භ කරන ලද ඉදිකිරීම් කටයුතු පිළිබඳ ව්‍යාපාරයේ ජනවාරි මුල් සතියට අදාල ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| ජනවාරි 01 | රුපියල් 80 0000ක ප්‍රාග්ධනය යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම. |
| ජනවාරි 03 | රුපියල් 200 000 ක බැංකු ණයක් ලබාගැනීම. |
| ජනවාරි 04 | ඉදිකිරීමේ කටයුතු වෙනුවෙන් රු. 5000ක ආදායමක් ඉපයීම. |
| ජනවාරි 05 | නිසල් විසින් තම පෞද්ගලික ප්‍රයෝජනයට රුපියල් 3000ක මුදලක් ව්‍යාපාරයෙන් ගැනීම. |

නිසල් විසින් ආරම්භ කරන ලද ව්‍යාපාරයේ ජනවාරි මුල් සතියට අදාළ ගනුදෙනු පහත ගිණුම්කරණ සමීකරණයට ගලපන්න.

වත්කම් = හිමිකම + වගකීම් (ල.04)

iv) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කිහිපයක බලපෑම ගිණුම්කරණ සමීකරණය අනුසාරයෙන් පහත දක්වේ.

| දිනය | වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| මාර්තු 01 | වැඩිවීම<br>අඩුවීම | = | - | + | - |
| මාර්තු 04 | අඩුවීම | = | | + | අඩුවීම |
| මාර්තු 05 | වැඩිවීම | = | වැඩිවීම | + | - |
| මාර්තු 06 | අඩුවීම | = | අඩුවීම | + | - |

මෙම සමීකරණයට අනුව එක් එක් දිනයේ සිදුවේ යැයි අපේක්ෂා කළ හැකි ගනුදෙනුව බැගින් වටිනාකම් සහිතව ලියන්න. (ල.04)

06) i) ජංගම දුරකථන අලුත්වැඩියා ව්‍යාපාරයක සිදුවිය හැකි මුදල් ලැබීම් ගනුදෙනු දෙකක් ලියන්න. (ල.02)

ii) මුදල් පොතකින් ඉටුවන ද්විත්ව කාර්යයන් නම් කරන්න. (ල.02)

iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

| | මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය | ගනුදෙනු වර්ගය |
|---|---|---|---|
| අ) | ගැනුම් ජ'නලය | A) ............................ | වෙළඳ භාණ්ඩ ණයට ගැනීම. |
| ආ) | B .................... | විකුණුම් ඉන්වොයිසිය | C. .................................. |
| ඉ) | D .................... | චෙක් පිළිපත | චෙක්පත් නිකුත් කිරීම. |

(ල.02)

iv) චෙතුකිගේ ව්‍යාපාරයේ 2024 මැයි මාසයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහතින් දැක්වේ.

| | | |
|---|---|---|
| 2024.05.01 | | මුදල් ශේෂය රු. 30000 |
| 2024.05.02 | ල.අ. 1 | අමතර ප්‍රාග්ධනය ලෙස රු. 70 000ක් යෙදවීම. |
| 2024.05.10 | ව.අ. 11 | ගෙවල් කුළිය රු. 15 000ක් ගෙවීම. |
| 2024.05.15 | ව.අ. 13 | විකිණීම සඳහා රු. 50 000ක බඩු තොගයක් මිලදී ගැනීම. |
| 2024.05.20 | ල.අ. 02 | අත්පිට විකුණුම් වලින් රු. 60,000ක් ලැබීම. |
| 2024.05.25 | ව.අ. 14 | මාසික විදුලි බිල රු. 5000ක් ගෙවීම. |

අවශ්‍ය වන්නේ,

අ) ඉහත ගණුදෙනු මුදල් පොත සටහන් කිරීම.

ආ) මුදල් පොත තුලනය කර ශේෂය සෙවීම. (ල.06)

07) i) වට්ටමක් යනු කුමක්ද? (ල.02)

ii) බැංකු ප්‍රකාශය යනු කුමක්ද? (ල.02)

iii) මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.02)

iv) සන්දීපගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කීපයක් පහතින් දැක්වේ.

| | |
|---|---|
| 2024 මාර්තු 01 | බැංකු ශේෂය හර රු. 24 000 |
| 2024 මාර්තු 05 | රු. 32 000ක් බැංකුවේ තැන්පත් කිරීම. |
| 2024 මාර්තු 12 | සුමුදුගෙන් ලැබී තිබූ අංක 300 දරණ රු. 15 000ක චෙක්පත බැංකුවේ තැන්පත් කිරීම. |
| 2024 මාර්තු 17 | ණයහිමි සරණිට රු. 25 000ක චෙක්පතක් නිකුත් කිරීම. |
| 2024 මාර්තු 25 | ව්‍යාපාරයේ විදුලි බිල රු. 7000ක් චෙක්පතකින් ගෙවීම. |

අවශ්‍ය වන්නේ,

i) සන්දීපගේ ව්‍යාපරයේ බැංකු ගිණුම් පිළියෙල කිරීම.

ii) බැංකු ගිණුම තුළනය කර ශේෂය සෙවීම. (ල.06)

* * *